# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date 2026.01.23 පැය 2250 | දුරකථන අංකය Tel.NO 011-2887973 | මගේ අංකය My NO D/Media/Out/ 134 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails dir.media@police.gov.lk |


**විදේශීය රටක නිෂ්පාදිත රිවොල්වර් අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ දිසා අපරාධ කොට්ඨාසය.**

2025.12.06 දින දෙහිවල, වනරත්න පාර ඒ ක්වාටස් ක්‍රීඩාපිටිය අසලදී ගිනි අවියකින් වෙඩි තබා පුද්ගලයෙකු ඝාතනය කර තවත් පුද්ගලයෙකුට තුවාල සිදුකර මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීමේ අපරාධය සම්බන්ධයෙන් බස්නාහිර පළාත් දකුණ දිසා අපරාධ කොට්ඨාසය මඟින් විමර්ශන සිදු කරමින් පවතී.

මෙම අපරාධය සිදු කිරීම සඳහා වෙඩික්කරුවන් දෙදෙනෙකු විසින් ගිනි අවි දෙකකින් වෙඩි තැබීම සිදුකර ඇති බවට අනාවරණය වී තිබුණි. කළුබෝවිල ප්‍රදේශයේ පදිංචි වෙඩික්කරුවෙකු ලෙස ක්‍රියා කල එක් සැකකරුවෙකු අපරාධය සිදු කිරීමට යොදා ගත් මෙරට නිෂ්පාදිත බෝර 16 වර්ගයේ ගිනි අවියක්ද සමඟ 2025.12.17 දින අත්අඩංගුවට ගෙන ගල්කිස්ස ගරු මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු මේ වනවිට රක්ෂිත බන්ධනාගාර ගතව ඇත.

2026.01.23 දින දහවල් කොට්ටාව පොලිස් වසමේදී බස්නාහිර පළාත් දකුණ දිසා අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ඉහත අපරාධයේ අනෙක් වෙඩික්කරු වශයෙන් ක්‍රියා කල සැකකරුද අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු අවුරුදු 35 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු යුධ හමුදාවට බැඳී නොදන්වා සේවයට වාර්තා නොකර සිට පසුව පොදු සමා කාලය තුල 2013 වර්ෂයේදී නීත්‍යානුකූලව සේවයෙන් ඉවත්ව ඇති බවට අනාවරණය වී ඇත. සැකකරුගෙන් සිදු කරන ලද වැඩිදුර ප්‍රශ්න කිරීමේදී අනාවරණය වූ තොරතුරු මත අපරාධය සිදු කිරීමට යොදා ගත් විදේශීය රටක නිෂ්පාදිත රිවෝල්වර් අවියක් දෙහිවල පොලිස් වසමේ පාළු නිවසක සඟවා තිබියදී සොයා ගෙන ඇත.

තවද මෙම සැකකරු සම්බන්ධයෙන් සිදු කල වැඩිදුර විමර්ශනයේදී, මොහු 2025.12.30 දින කොහුවල පොලිස් වසමේ බෝධිවත්ත ප්‍රදේශයේදී නිවසක් ඉදිරිපිට සිටි අවුරුදු 16 ක ගැහැණු ළමයෙකුට රිවෝල්වර් අවියකින් වෙඩි තබා තුවාල සිදුකර මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීමේ අපරාධයේද වෙඩික්කරු වශයෙන් ක්‍රියා කර ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෙම අපරාධයන් දෙකම දැනට විදේශගතව සිටින සංවිධානාත්මක අපරාධ හා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකුගේ මෙහෙයවීම මත සිදු කර ඇති බවටද අනාවරණය වී ඇත. සැකකරු 2026.01.24 වන දින ගල්කිස්ස ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

බස්නාහිර පළාත් දකුණ දිසා අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

## வெளிநாட்டில் தயாரிக்கப்பட்ட சுழல் துப்பாக்கியுடன் சந்தேகநபர் கைது – மேல் மாகாண தெற்கு பிராந்திய குற்றப் பிரிவு

2025.12.06 அன்று, **தெஹிவளை, வனரத்தன வீதியின், ஏக் க்வாட்டஸ் விளையாட்டு மைதானம் அருகே**, நபர் ஒருவரை துப்பாக்கி பிரயோகம் மேற்கொண்டு **கொலை செய்து**, மற்றொரு நபரை காயமடைத்தல் சம்பந்தமாக **மனித கொலை முயற்சி** குற்றம் தொடர்பாக **மேல் மாகாண தெற்கு பிராந்திய குற்றப் பிரிவு** விசாரணைகளை நடத்தி வருகிறது.

இக் குற்றத்தைச் செய்வதற்காக இரண்டு துப்பாக்கிதாரிகளால் இரண்டு துப்பாக்கியில் துப்பாக்கிப் பிரயோகம் மேற்கொள்ளப்பட்டுள்ளதாக தெரியவந்துள்ளது. **கலுபோவில பிரதேசத்தைச் சேர்ந்த துப்பாக்கிதாரியாக செயல்பட்ட சந்தேகநபர் குற்றத்தை மேற்கொள்வதற்காக பயன்படுத்திய இந்** நாட்டில் தயாரிக்கப்பட்ட **16 ரக துப்பாக்கியுடன்** 2025.12.17 அன்று கைது செய்யப்பட்டு **கல்கிசை கௌரவ நீதிமன்றில் முன்னிலைப் படுத்தியதன் பின்னர் தற்போது விளக்கமறியலில் வைக்கப்பட்டுள்ளார்.**

2026.01.23 அன்று மதியம், **கொட்டாவை பொலிஸ் பிரிவில்**, மேல் மாகாண தெற்கு பிராந்திய குற்றப் பிரிவின் அதிகாரிகளினால், இக் குற்றத்துடன் தொடர்புடையஏனைய துப்பாக்கிதாரியாக செயற்பட்ட சந்தேகநபர் கைது செய்யப்பட்டுள்ளார்.

கைது செய்யப்பட்ட சந்தேகநபர் **35 வயது, தெஹிவளை பகுதியை சேர்ந்தவர்**.

சந்தேகநபர் இராணுவத்தில் சேர்ந்து அறிவிக்காமல் சேவையில் இணையாமல் பின்னர் பொது மன்னிப்பின் கீழ் 2013 ஆம் ஆண்டு சட்டரீதியாக சேவையிலிருந்து விழகியுள்ளதாக தெரியவந்துள்ளது. சந்தேகநபரிடமிருந்து மேற்கொள்ளப்பட்ட மேலதிக விசாரணையில் தெரியவந்ததாவது தகவலின் அடிப்படையில் குற்றத்தை மேற்கொள்வதற்காக பயன்படுத்திய வெளிநாட்டில் தயாரிக்கப்பட்ட சுழல் துப்பாக்கி ஒன்று தெஹிவளை பொலிஸ் பிரிவில் பாலடைந்த வீடு ஒன்றில் மறைத்து வைக்கப்பட்டிருந்த போது கைப்பற்றப்பட்டுள்ளது.

மேலும், இச் சந்தேகநபர் தொடர்பாக மேற்கொள்ளப்பட்ட மேலதிக விசாரணைகளின் போது, இவர் 2025.12.30 ஆந் திகதி கொஹுவலை பொலிஸ் பிரிவிற்குட்பட்ட

போதிவத்தை பிரதேசத்தில் வீடு ஒன்றுக்கு முன்பாக 16 வயதுடைய பெண் ஒருவரை சுழல் துப்பாக்கியால் துப்பாக்கி பிரயோகம் மேற்கொண்டு மனித படுகொலை செய்வதற்கு முயற்சித்த குற்றத்திற்காக துப்பாக்கிதாரியாக செயல்பட்டதாக விசாரணையில் தெரியவந்துள்ளது.

இவ்விரண்டு குற்றங்களையும் தற்போது வெளிநாட்டிலுள்ள திட்டமிடப்பட்ட குற்றங்கள் மற்றும் போதைப்பொருள் கடத்தல்காரர் ஒருவரின் வழிநடத்தலின் கீழ் இக் குற்றங்களை புரிந்துள்ளதாக தெரியவந்துள்ளது. சந்தேகநபர் 24.01.2026 ஆந் திகதி கல்கிசை கௌரவ நீதிவான் நீதிமன்றில் முன்னிலைப் படுத்துவதற்கு திட்டமிடப்பட்டுள்ளது.

மேல் மாகாண தெற்கு பிராந்திய குற்றப் பிரிவினரால் மேலதிக விசாரணைகள் மேற்கொள்ளப்பட்டு வருகின்றது.

***பொலிஸ் ஊடக பிரிவு***

**Suspect Arrested with Foreign-Manufactured Revolver – Western Province Southern District Crime Division**

The Western Province Southern District Crime Division is conducting investigations into an attempted murder committed by discharging a firearm at a person near the Quarters Playground on Wanaratne Road, Dehiwala, on 06.12.2025.

Investigations have revealed that two shooters used two separate firearms to carry out the attack. One suspect, who acted as a shooter and is a resident of Kalubowila, was arrested on 17.12.2025 along with a locally manufactured 16-bore firearm used in the commission of the offence. He was subsequently produced before the Mount Lavinia Magistrate’s Court and remanded.

On the afternoon of 23.01.2026, officers of the Western Province Southern District Crime Division arrested the second shooter involved in the same incident within the Kottawa Police Division. The suspect is a 35-year-old resident of the Dehiwala area.

Further inquiries revealed that the suspect had failed to report for military duty without official notification and had later legally been discharged from the Army in 2013 under the general amnesty period. Based on information obtained during extended interrogation, a foreign-manufactured revolver used in the offence was recovered from an abandoned house located within the Dehiwala Police Division.

Additional investigations disclosed that the same suspect had also acted as the shooter in another attempted murder, in which a 16-year-old girl was shot and injured with a revolver while standing in front of a residence in the Bodhiwatta area of the Kohuwala Police Division on 30.12.2025.

It has further been revealed that both crimes were carried out under the instructions of an organized criminal and drug trafficker currently residing overseas. The suspect is scheduled to be produced before the Mount Lavinia Magistrate’s Court on 24.01.2026.

The Western Province Southern District Crime Division is continuing further investigations.

**Police Media Division**